****** සාමාජික / සාමාජිකාවන්ගේ වගකීම ******

- මෙම යෝජනා ක්‍රමය සඳහා අයවිය යුතු දායක මුදල් නිසියාකාරව අයවීම පිළිබඳව පුද්ගලිකවම සැලකිලිමත් විය යුතුවේ'

- කොට්ඨාශයකින් වෙනත් කොට්ඨාශයකට ස්ථාන මාරුවීම් ලබා යෑමේදී තම දායක මුදල් අයවීම පිළිබඳව සැලකිලිමත් විය යුතු වන අතර, දායක මුදල් අය නොවන්නේ නම් ඒ පිළිබඳව තම වැටුප් කාර්යාලය හා මෙම යෝජනා ක්‍රමය දැනුවත් කිරීමට කටයුතු කල යුතුවේ'

- විවාහය, දරු උපත්, නම වෙනස් කිරීම් සහ දික්කසාද ආදී තොරතුරු වෙනස් කිරීම් මෙම යෝජනා ක්‍රමය වෙත දැනුම්දීමට කටයුතු කල යුතු අතර ඒ සඳහා ශ්‍රී ලංකා පොලිස් ම'සු'ස' යහසාධක යෝජනා ක්‍රමය විසින් නිකුත් කරනු ලබන පෝරම අංක 06 සම්පූර්ණ කල යුතුවේ'

## වැඩි විස්තර සඳහා

පරිපාලන නිලධාරී,
පොලිස් ම.සු.ස. යහසාධක යෝජනා ක්‍රමය

දුරකතන අංක ៖ 011 - 232 8786 හා
011 - 239 9527 අමතන්න

**තැපැල් ලිපිනය**

පරිපාලන නිලධාරී,
පොලිස් ම'සු'ස' යහසාධක යෝජනා ක්‍රමය,
2 වෙනි මහල,
පොලිස් සුහසාධක ගොඩනැඟිල්ල,
නො'331, ඕල්කොට් මාවත,
කොළඹ 11'

**ශ්‍රී ලංකා පොලිස් ම'සු'ස' යහසාධක යෝජනා ක්‍රමය මඟින් ලබා දෙනු ලබන දීමනා හා ප්‍රතිලාභ**

සාමාජික / සාමාජිකාවන් සඳහා

1. විශ්‍රාමය හෝ විශ්‍රාමය හැර මොනයම් ක්‍රමයකින් හෝ සේවය හැරයෑම / ඉල්ලා අස්වීම ආදිය සඳහා,
    - සාමාජිකත්වය ලබා සිටි කාලය තුලදී දායක මුදල් වශයෙන් ගෙවා ඇති සම්පූර්ණ මුදලත්, එම මුදල ආයෝජනය කිරීමෙන් යෝජනා ක්‍රමය උපයා ඇති පොළියෙන් 60% ක් ගෙවනු ලැබේ.

2. සාමාජිකයෙකු/සාමාජිකාවක ගේ අභාවයකදී ඔහුගේ/ඇයගේ යැපෙන්නන් සඳහා,
    - රු.50,000/- +මුළු සාමාජික මුදලද +50% පොළී මුදල

3. අවමංගල්‍යාධාර :-
    - භාර්යාවට හෝ ස්වාමිපුරුෂයාට - රු'10,000/-
    - සාමාජික සාමාජිකාවන්ගේ දෙමව්පියන්ට - රු' 5,000/- *(එක් අයෙකුට)*
    - යැපෙන දරුවන්ට - රු' 8,000/- *(වයස අවු'18 අඩු හෝ අවිවාහක ගැහැණු දරුවෙකුට)*
    - ළදරුවෙකුට (වයස අවුරුද්දට අඩු) - රු' 5,000/-

4. අසනීපයක් සඳහා රෝහල්ගත වීමකදී,
    - සතියකට රු'500/- බැගින් අවමය සති 02 සිට උපරිමය සති 20 දක්වා - රු'10,000/-
    - සෙංගමාලය/අංශභාගය සඳහා රෝහල්ගතව හෝ අසනීප නිවාඩු දින ගණන අවමය සති 02 කට හා උපරිමය සති 20කට යටත්ව ගෙවනු ඇත - රු'10,000/-'

5. අනතුරක් සඳහා රෝහල්ගත වීමකදී / අසනීප නිවාඩු සිටීම,
    - සතියකට රු'500/- බැගින් අවමය සති 02 සිට උපරිමය සති 20 දක්වා - රු'10,000/-

6. සංක්‍රාමික රෝග (අවමය සති 02 ක් සඳහා) - රු' 1,500/-
   (පැපොල, සරම්ප, කම්මුල්ගාය)

7. හදිසි අනතුරු සඳහා,
    - අවයව දෙකක් අහිමිවීම (අත්, පා, ඇස්) - රු'40,000/-
    - අවයවයක් අහිමිවීම (අත්, පා, ඇස්) - රු'20,000/-

8. ඉපයීමේ ශක්තිය හීන වීම මත ගෙවනු ලබන දීමනාව - රු'20,000/-
   *(ඉපයීමේ ශක්තිය හීනවීමේ අනුපාතය අනුව ගෙවීම් සිදුකෙරේ)*

9. ප්‍රසූත දීමනා (දරු උපත් 03ක් දක්වා පමණයි) -රු' 3,000/-
   *(මෙම දීමනාව මෙහි සාමාජිකාවන් වන නිලධාරිණියන් සඳහා පමණක් ගෙවනු ලැබේ')*

**** (ඉහත සඳහන් 4,5 සහ 6 යන දීමනා සඳහා අවමය සති 02 ගනන් බැලීමේදී 2 වන සතියේ දින 04ක් ඇත්නම් එය සතියක් ලෙස සලකනු ලබන අතර,** මෙහි සාමාජික / සාමාජිකාවන් සඳහා වන ප්‍රතිලාභ හා දීමනා සඳහා අයදුම් කිරීමේදී ගිණුම් වර්ෂ දෙකක් තුල අයදුම් කල යුතු වේ')*

<u>**සාමාජික / සාමාජිකාවන්ගේ දරුවන් සඳහා**</u>

1. පළමු වසරට ඇතුලත් වන දරුවෙකු සඳහා -රු'1,000/-

2. 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවකු සඳහා -රු'2,500/-

3. පාසැල් පොත් :-
    - සාමාජික / සාමාජිකාවන්ගේ උසස්පෙළ හදාරන දරුවන් හට පාවිච්චි කොට ආපසු භාර දීමේ පදනම යටතේ මුද්‍රිත පාඩම් පොත් ලබා දීම'

4. විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව :-
    - වාර්ෂික වටිනාකම රු.19,000/-(මාසික රු.1,900/-) අධ්‍යයන වර්ෂයකට ශිෂ්‍යත්ව තුන (03) බැගින් විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම (සාමාජික /සාමාජිකාවන්ගේ අපොස උසස්පෙළ විභාගයේ ප්‍රථිඵල මත, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පාලනය වන විශ්ව විද්‍යාල වලට ඇතුලත් වන සියළුම දරුවන් හට මේ සඳහා ඉල්ලුම් කල හැක)

5. විශ්ව විද්‍යාල ශිෂ්‍යාධාර :-
    - වාර්ෂික වටිනාකම රු.10,000/-(මාසික රු.1,000/-) (සාමාජික /සාමාජිකාවන්ගේ අපොස උසස්පෙළ විභාගයේ ප්‍රථිඵල මත, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පාලනය වන විශ්ව විද්‍යාල වලට ඇතුලත් වන සියළුම දරුවන් සඳහා )

*(මව හා පියා දෙදෙනාම මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය දරන කල්හී මෙහි ඉහත සඳහන් දීමනාවන් ඉන් එක් අයෙක් සඳහා පමණක් ගෙවනු ලැබේ)*

**** මෙහි සාමාජික / සාමාජිකාවන්ගේ දරුවන් සඳහා වන දීමනා හා ප්‍රතිලාභ සඳහා අයදුම් කිරීමේදී අදාල අධ්‍යයන වර්ෂය තුල ඒ සඳහා අයදුම් කල යුතු වේ'***

*** ***ඉහත සඳහන් සියළුම දීමනා සඳහා ව්‍යවස්ථාවට අනුකූලව ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ'***

<u>**වෙනත් පහසුකම්**</u>

- සහන සේවා මධ්‍යස්ථානය :-

සෑම සාමාජිකයෙකුටම සහන සේවා පදනම මත අවශ්‍ය කරන ගෘහ විදුලි උපාංග ආදිය සුභසාධක අලෙවිසැලෙන් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.